## ලංකාවේ කොරෝනා පාලනය වී ඇතැයිද, විදේශිකයින් මගින් කොරෝනා පැතිරීම වැඩි වී ඇතැයි ද ආණ්ඩුව කියන කතා බොරු..!

**-රවි කුමුදේශ්**




(ලංකා ඊ නිව්ස් -2021.අප්‍රේල්.20, ප.ව.4.00) කොවිඩ් පිළිබඳව සෞඛ්‍ය අමාත්‍යාංශයේ දත්ත පිළිබඳව සැලකීමේදී විද්‍යාත්මක ආවේක්ෂණ ක්‍රියාවලියක් ක්‍රියාතමක නොවන බව පැහැදිළි වේ. රට තුළ රෝගය අඩු වනවා ද යන්න පිළිබඳව විද්‍යාත්මක පුරෝකථන කිරීම සඳහා විධිමත් කෝවිඩ් පරීක්ෂණ ක්‍රියාවලියක් මගින් ලබා ගන්නා නිවැරදි දත්ත ඊට පදනම් කර ගත යුතුය.

ඒ සඳහා අහඹු පරීක්ෂණ, සක්‍රිය ලෙස හාඹා යෑමේ පරීක්ෂණ සහ රෝහල් වලට ඇතුල් වූ රෝගීන්ගේ අක්‍රීය පරීක්ෂණ නිසි ව්‍යාප්තියකින් සිදු විය යුතුය. මේ වන විට අප අහඹු පරීක්ෂණ රෝගී ප්‍රවණතාවය, සක්‍රීය සහ අක්‍රීය පරීක්ෂණ ප්‍රවණතාවයන් පිළිබඳ කිසිදු දත්තයක් සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් ඉදිරිපත් නොකරන බැවින් සහ එම දත්ත ජනනය කර ගැනීම සඳහා නිසි පරීක්ෂණ ක්‍රියාවලියක් ද නොපවතින බැවින්, අවිධිමත් දත්ත පදනම් කර ගනිමි සිදු කරණු ලබන බොහෝ ප්‍රකාශ සහ පුරෝකථනයන් නිවැරදි නොවීමට ඇති ඉඩ වැඩිය.

ඒ අනුව ශ්‍රී ලංකාව තුළ රෝගය අඩුවෙමින් හෝ පාලනය කර ඇති බවට සෞඛ්‍ය අමාත්‍යවරිය විසින් කරන ප්‍රකාශයට ද විද්‍යාත්මක පදනමක් නැත.

පසුගිය දින දහය තුළ පමණක් PCR පරීක්ෂණ 68000 ක පමණ ප්‍රමාණයක් සිදුකර ඇති අතර එමගින් 2500කට වඩා වැඩි අසාධිතයින් ප්‍රමාණයක් සොයා ගැනීමට හැකි වී ඇත. ආසාදිතයන් හමුවීමේ ප්‍රමාණය, සැබෑ ආසාධිතයින් ප්‍රමාණයට වඩා, පරීක්ෂණ සිදු කරන ප්‍රමාණය අනුව විචලනය වන බව අදාල දත්ත සරල අධ්‍යනයේදී පැහැදිලිවම පෙනෙන්නට තිබේ.

*** අප්‍රේල් 10 පරීක්ෂණ 8000 රෝගීන් 412**
*** අප්‍රේල් 14 පරීක්ෂණ 4074 රෝගීන් 151**
*** අප්‍රේල් 17 පරීක්ෂණ 6000 රෝගීන් 357**

ඒ අනුව, සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් පරීක්ෂණ සිදු කරන ප්‍රමාණය ඉහළ පහළ දැමීමේ විද්‍යාත්ම හේතුව පැහැදිලි නොමැති නමුත්, පරීක්ෂණ සිදු කරනු ලබන ප්‍රමාණයට අනුව හමුවන රෝගීන් ප්‍රමාණය අඩු වැඩි වන බව ඉතා පැහැදිලිය.

### විදේශිකයන්ගේ කතාවත් බොරු..

තවද, වසංගත රෝග අංශයේ ප්‍රකාශනයකට අනුව විදේශිකයින්ගේ ආසාදිතයන් හමුවීම ඉතා ඉහළ අගයක පවතින බව ප්‍රකාශ වුවද, ඒ පිළිබඳව ද විද්‍යාත්මක දත්ත ඒකරාශී කරගත් විද්‍යාත්මක ක්‍රියාවලිය පිළිබඳව ඔවුන් මෙතෙක් අනාවරණය කර නැත. එබැවින් පදනම් විරහිත දත්ත අවිධිමත්ව සලකා බලා, රටට විදේශ ආගමනිකයින් ගෙන්වා ගැනීම පිළිබඳව නීති රෙගුලාසි සංශෝධනය කිරීම නිෂ්ඵල ක්‍රියාවකි.

පෞද්ගලික රසායනාගාර වලට මුදල් ලබා ගැනීමේ අපේක්ෂාව පෙරදැරිව සියළු විදෙස් ආගමනිකයින්ගේ PCR පරීක්ෂණ හඹා ගොස් එකක් නැර සිදු කළ ද, රට තුල සිදුවන PCR ප්‍රමාණය දිනපතා අඩු කෙරෙමින් පවතී. ඒ අනුව විදේශිකයින්ගේ නියැදිය 100% පරීක්ෂා කිරීමට සාපෙක්ෂව, රටතුල නියැදියෙහි පරීක්ෂණ පන්දහසක්වත් සිදු නොකරමින්, වාර්ථාවන ආසාධිතයින් ගණන පමණක් සංසන්දනය කිරීම අවිද්‍යාත්මකය.

### බන්ධනාගාර තත්ත්වය..

දැනට රටතුල ලැබෙමින් පවතින හා ලැබෙන ප්‍රතිඵල සැලකීමේදී ද, අප්‍රේල් මස දහවන දින පමණක් වැලිකඩ බන්ධනාගාර රැඳවියන් 131 දෙනෙකු පරික්ෂා කිරීමේදී 100 කට අධික ප්‍රමාණයක් ආසාදිතයන් ලෙස හඳුනාගෙන ඇත. එම එක් ආසාදිතයකු ට අදාළව ආශ්‍රිතයන් දෙදෙනකු හඳුනා ගත්තේ නම් අවම වශයෙන් 300 ක පමණ පරීක්ෂණ ප්‍රමාණයක් සිදු කළ යුතු වුව ද, ඊයේ දින දක්වා සිදු කර ඇත්තේ පරීක්ෂණ 100 කට වඩා අඩු ප්‍රමාණයකි.

තවද අප්‍රේල් මස 16 වන දින කුලියාපිටිය ප්‍රදේශයේ සිදු කල PCR පරිකෂණ 50 කින් පමණ, අසාධිතයින් 40ක් පමණ හඳුනාගෙන ඇත. එසේම පසුගිය දින 10ක කාලය තුළ රට තුල සිදු කර ඇත්තේ පරීක්ෂණ 68000 ක පමණ අවම ප්‍රමාණයක් වන අතර, ඉන් 2500 කට වඩා වැඩි ප්‍රමාණයක් ආසාධිතයින් ලෙස වාර්ථා වී ඇත.

එම තත්ත්වයට අනුව ශ්‍රී ලංකාව තුළ විදේශයන්ට වඩා රෝගය අඩු ප්‍රමාණයකින් පවතින බව සඳහන් කිරීම විද්‍යාත්මක යථාර්ථයක් නොවේ.

**ලක්ෂය පැන්නා..**

මේ අතර රසායනාගාර සේවාවේ නිල දත්තයන්ට අනුව 2021.04.03 දින වන විට ශ්‍රී ලංකාව තුල කොවිඩ් ආසාධිතයින් සංඛ්‍යාව ලක්ෂයේ සීමාව පසු කර තිබේ.

ඒ අනුව ශ්‍රී ලංකාවේ කොවිඩ් අසාධිතයින් සංඛ්‍යාව 1003640 බව වාර්ථා වේ.

කෙසේ නමුත් සෞඛ්‍ය අමාත්‍යාංශයේ වසංගත රෝග අංශය විසින් නිකුත් කරණු ලබන නිල වාර්ථාවන්ට අනුව ශ්‍රී ලංකාව තුල කොවිඩ් අසාධිතයින් ප්‍රමාණය ලෙස දක්වා ඇත්තේ 96000 ක පමණ ප්‍රමාණයකි.

මාස අටක පමණ කාලයක් තිස්සේ එලෙස, සෞඛ්‍ය අමාත්‍යාංශ නිල දත්ත අතර පරස්පරයක් පවතින නමුත්, ඒ පිළිබඳ නිවැරදි කිරීමක් මෙතෙක් සිදු වී නොමැත.

එසේම මෙකී නිල දත්ත පරස්පරය මගින් ඉතා පැහැදිලිව පෙනෙන්නට ඇත්තේ සෞඛ්‍ය අමාත්‍යාංශය කොවිඩ් වසංගතය පිළිබඳව සංඛ්‍යාත්මක දක්ෂයන් පිළිබඳව පටලැවිල්ලක සිටින බවය. ඒ හේතුව නිසාම ඒ මත පදනම්ව සිදු කරන ප්‍රකාශ විද්‍යාත්මක නොවන, හුදු ප්‍රකාශ පමණක් බවට පත් විය හැකි බැවින්, ප්‍රකාශ නිකුත් කිරීමේදී සැලකිලිමත් වන ලෙස අප සෞඛ්‍ය අමාත්‍ය වරියගෙන් ඉල්ලා සිටිමු.

වසංගතය පැතිරී වසරකට අධික කාලයක් ගත වී තිබියදී පවා, වසංගතයට අදාල දත්ත නියාමනය කිරීම සඳහා නිශ්චිත "තොරතුරු කලමනාකරණ පද්ධතියක්" ස්ථාපිත කර ගැනීමට වසංගත රෝග අංශයට නොහැකිවීම බරපතල නොසලකා හැරීමකි.

**රවී කුමුදේශ්**

**සභාපති**
**වෛද්‍ය රසායනාගාර විද්‍යාඥ වෘත්තීයවේදීන් විද්වත් සංගමය**

---------------------------
by (2021-04-20 10:49:57)

ඔබගේ කාරුණික පරිත්‍යාගයෙන් තොරව ලංකා ඊ නිව්ස් පවත්වාගෙන යා නොහැක.



(https://s3.lankaenews.com/si_news_image/Gvt-Lie.jpg)

(https://www.facebook.com/sharer.php?u=https://www.lankaenews.com/news/11985/si) (https://twitter.com/home?status=ලංකාවේ කොරෝනා පාලනය වී ඇතැයිද, විදේශිකයින් මගින් කොරෝනා පැතිරීම වැඩි වී ඇතැයි ද ආණ්ඩුව කියන කතා බොරු..!+https://www.lankaenews.com/news/11985/si) (https://pinterest.com/pin/create/button/?url=https://www.lankaenews.com/news/11985/si&media=https://s3.lankaenews.com/si_news_image/Gvt-Lie.jpg&description=ලංකාවේ කොරෝනා පාලනය වී ඇතැයිද, විදේශිකයින් මගින් කොරෝනා පැතිරීම වැඩි වී ඇතැයි ද ආණ්ඩුව කියන කතා බොරු..!) (https://plus.google.com/share?url=https://www.lankaenews.com/news/11985/si/si) (mailto:?subject=LankaEnews.com&body=https://www.lankaenews.com/news/11985/si/si) (/home/print_page/11985/si)

***Read 8112 Times***

**Leave a Reply**

Donate

0 discussion on this news


### News Categories

අධිකරණ (/category/22)

අප්පු-ආමි ගේ කොළම (/category/59)

අඹයාගේ ඇඹුල (/category/40)

ආචාර්ය අමලානන්ද ගේ ලිපි (/category/53)

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවකට මහජන යෝජනා (/category/31)

ආනන්දගේ පරිවර්තන (/category/68)

ආනුභාවනන්දගේ ලිපි (/category/33)

ආරක්ෂක (/category/18)

more (/features)

### Links

Today's Exchange Rate (http://www.oanda.com/currency/co

Government Links (http://www.priu.gov.lk/Gov_Links.h

Facts of Sri Lanka (https://www.cia.gov/library/publicat world-factbook/geos/ce.html)

Today's Share Price - Colombo (http://www.cse.lk/welcome.htm)

Images of Ceylon in 1840 (http://www.imagesofceylon.com/cc

Government Gazette (http://www.dailynews.lk/2001/pix/g